# සමානාත්මතා ප්‍රතිපත්තිය

# ශ්‍රී ජයවර්ධනපුර විශ්වද්‍යාලය.

# ශ්‍රී ලංකාව.

**01. හැඳින්වීම**

සමානාත්මතාවය යනු සියල්ලන් සමාන ස්ථරයෙහි ලා සැලකීම හා විශ්වයම වර්තමානයේ පිළිගන්නා පරිදි සියලු දෙනාට එකසේ සමව නොවෙනස්ව සැලකීම හා පිළිගැනීමයි. එය සමස්ථ ලෝකයම අසමානතාවය පිටුදැකීම උදෙසා පිළිගනු ලබන්නකි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය තුළ ක්‍රියාත්මත වන්නාවූ සමානාත්මතා ප්‍රතිපත්තිය තුළින් එතුළ සිටින අධයයන, අනධ්‍යයන, ශිෂ්‍ය යන සියල්ලන්ගේ සම අවස්ථා ප්‍රවර්ධනය සිදු කරයි.

එමෙන්ම විශ්ව විද්‍යාලයීය සංස්කෘතිය තුළින් ද විවිධත්වය අගය කරන්නා වූ ද ඒක පුද්ගල වෙනස්තම් හා අත්දැකීම් සියුම් ලෙස බලපානු ලබන ලෙස ප්‍රවර්ධනය කිරීමට විශ්වවිද්‍යාලයීය පීඨ හා දෙපාර්තමේන්තු කටයුතු කරනු ලබයි.

විශ්වවිද්‍යාලය තුළින් ඇති විය හැකි යැයි අනුමාන කරන වෙනස්කම් කිරීම් මානසික මෙන්ම ශාරීරික හිරිහැර කිරීම් හා වධ බන්ධන වලට ගොදුරු වීම් සියල්ල අවහිර කරමින් සියලු දෙනා හට තනි පුද්ගලයෙකු වශයෙන් සමානාත්මතාවය ඉතා ඉහළින් ආරක්ෂා කරමින් සියලුම විෂය හා විෂය පරිභාහිර ක්‍රියාවන්හි ඕනෑම මට්ටමකින් යෙදීමට ඉඩ ප්‍රස්ථාව සලසා ඇත.

මෙම ප්‍රතිපත්තිය ස්ත්‍රී- පුරුෂභාවය ප්‍රධාන කොටගෙන පෙලගස්වා ඇත. ශ්‍රී ලාංකේය විශ්වවිද්‍යාල තුළ විද්‍යාර්ථීන් ප්‍රතිපත්තිමය වශයෙන් හා විනයානුකූලව 12 III වන පරිච්ඡේදයේ (2) මූලික අයිතීන් යන නීතියට එක්සත් ජාතීන්ගේ මූලික අයිතිවාසිකම් ප්‍රඥප්තියට අනුව පිළිගත යුතුය.

**02.තාර්කිකභාවය**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය සමානාත්මතා ප්‍රතිපත්තිය එහි සිටින සියලුම සමාජිකයන් කෙරෙහි ස්ත්‍රී- පුරුෂ, වාර්ගිකත්වය, ආගම, අබාධිතබව, වයස, විවාහක අවිවාහකබව, ගර්භණී-මාතෘභාවය, භාෂාව, වෘත්තීය සමිති සමාගම්, සමාජිකත්වය හා දරණ දේශපාලන මතය, හෝ වෙනත් හේතුන් හෝ මත පදනම් නොවී ක්‍රියාත්මක කෙරෙනු ලබයි.

විශ්වවිද්‍යාලය එහි සියලු විද්‍යාඥයින්ගේ මෙන්ම කාර්ය මණ්ඩලයේ මෙන් මෙන්ම අනිකුත් සියලු දෙනාගේ ගෞරවය ආරක්ෂා කරමින් සමානාත්මතා අයිතිය තහවුරු කිරීමට කටයුතු කරනු ලබයි.

මෙම ප්‍රති ප්‍රතිපත්තිය මගින් විශ්වවිද්‍යාලය විසින් ඒ ප්‍රායෝග විද්‍යාලය විසින් ඒ ප්‍රායෝගිකව කිනම් අයුරකින් දේශීය හා අන්තර්ජාතික මට්ටමින් පීඨ හා දෙපාර්තමේන්තුව හරහා පිළිගනු ලබන්නේ ද යන්න පැහැදිලි කරයි එහි මේ සඳහා විශ්වවිද්‍යාල විසින් කරනු ලබන කැපකිරීම් හා මඟ පෙන්වීම් හා එහි සාමාජිකයන් ඒ සඳහා මෙහෙයුම් ලබන ආකාරය පිළිබඳව තොරතුරු අඩංගු වේ.

එක් එක් පුද්ගලයාට ආවේණික සුවිශේෂී ගති ලක්ෂණ හා හඳුනා ගනිමින්, ඒවාට ගෞරව කරමින් හා සමව සලකමින් විශ්වවිද්‍යාලයතුළ දී කටයුතු කරනු ලබයි. කල්තියා විශ්වවිද්‍යාලය විසින් හඳුනාගනු ලබන ගොදුරුකරණය, වෙනස්කම් කිරීම්, හිරිහැර කිරීම් මෙන්ම වදබාධන පැමිණවීම් එදිනෙදා හමුවන සමකාලීනයන්ගෙන්, සමවයස් පුද්ගලයන්ගෙන්, විද්‍යාර්ථීන්ගෙන් හෝ අධ්‍යයන මෙන්ම අනධ්‍යන සාමාජිකයින්ගෙන් හෝ සිදු නොවී සමානාත්මතාවය ගරු කිරීමට විශ්වවිද්‍යාලය බැඳී සිටී.

මෙය එදිනෙදා විශ්වවිද්‍යාලය ඉගෙනුම් ඉගැන්වීම්, පර්යේෂණ ක්‍රමවේදයන් තුළ මෙන්ම විශ්වවිද්‍යාලීය ප්‍රතිපත්ති හා පරිපාලන මෙන්ම ශිෂ්‍ය විෂය පරිබාහිර ක්‍රියා ක්‍රියාකාරකම් තුළින් ද මොනවට විදහාපානු ලබයි.

කිසිදු පුද්ගලයෙකු වෙත කිසිදු අයුරකින් බලපෑම් එල්ල නොවන පරිදි ආතතියට ලක් නොවන ලෙස මෙන්ම රෝගාබාධයන්ට ගොදුරු නොවී පන්ති නොපැමිණීමකින් තොරව පවත්වාගෙන යාම විශ්වවිද්‍යාලීය සමානාත්මතා ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේ අරමුණයි.

**03.සමානාත්මතාව- අරුත් ගැන්වීම**

සමානාත්මතාවය පවත්වා පවත්වාගෙන යාමට බලපාන ගොදුරුකරණය වෙනස්කම් කිරීම් හිරිහැර කිරීම් වධ බක්දනට පැමිණවීම් ආදියට ඉඩ ප්‍රස්ථාව නොදෙමින් සියලු දෙනා එක හා සමානව සලකමින් එක හා සමාන අවස්ථා ලබා දී ගෞරවය රැක ගැනීම මෙහි අරමුණයි.

**04. විෂය පථය**

සියලුම විශ්වවිද්‍යාලයීය සමාජිකයින් කෙරෙහි විශ්වවිද්‍යාලීය සමානාත්මතා ප්‍රතිපත්තිය බලපැවැත්වේ. සාමාජිකයන් ගණයට අභ්‍යන්තර හා බාහිර විද්‍යාර්ථීන්, අධ්‍යයන කාර්ය මණ්ඩලය, මෙන්ම අනධ්‍යයන කාර්ය මණ්ඩලය අයත් වේ. සමානාත්මතා ප්‍රතිපත්තිය විශ්වවිද්‍යාලීය ප්‍රතිපත්ති, පුරුදු, ක්‍රියාවලීන්, සම්මතයන් සේම ඒ හා සබැඳුණු පන්ති කාමර සම්බන්ධතා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය, පර්යේෂණ හා නිර්මාණාත්මක ක්‍රියාවලිය, සහයෝගිතා ක්‍රියාවලීන්, පරිපාලන ක්‍රියාවලින්, {බඳවාගැනීම්, ප්‍රවර්ධන, පුහුණු කිරීම හා ඉදිරිපත් කිරීම් ඇගයීම් (අධ්‍යයන හා අනධ්‍යයන)} සහ ශිෂ්‍ය විෂය පරිබාහිර ක්‍රියාවලින් තුළින් විද්‍යමාන වේ.

ප්‍රතිපත්තිමය අරමුණු රටෙහි උසස් අධ්‍යාපනයෙහි විශේෂ භූමිකාවක් රඟ දක්වන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය එහි පුළුල් සමාජ කොට්ඨාසය තුළ සමානාත්මතාවය ව්‍යාප්ත කරනු ලබයි. පහලින් දක්වා ඇති අරමුණු විශ්වවිද්‍යාලීය සමානාත්මතා ප්‍රතිපත්තිය ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවී මෙහිලා උපකාරී වේ.

- සියලු දෙනාටම එක හා සමානව සැලකීම: සාමාජිකයින්ට ඔවුන්ගේ ස්ත්‍රී-පුරුෂ බව, වාර්ගිකත්වය, ආගම, ආබාධිතබව, වයස, විවාහක අවිවාහකබව, ගර්භනි-මාතෘභාවය, භාෂාව වෘත්තීය සමිති සාමාජිකත්වය හෝ දරන දේශපාලන මතය හෝ වෙනයම් හේතුවක් මත හෝ පදනම්ව වෙනස්ව නොසැලකීම.
- තනි පුද්ගලයාගේ ගෞරවය ආරක්ෂා කිරීම්: සෑම පුද්ගලයෙකුටම ගෞරවය නිසි ලෙස ලැබිය යුතු බව.
- ස්වකීය පුද්ගලික විවිධත්වය හඳුනාගැනීමේ හා ගෞරව කිරීම: එකිනෙකාගේ විෂමතා හඳුනාගැනීම හා එම විවිධත්වය ඇගයීම ඉවසීම.
- එකෙක් සාමාජිකයාගේ හැකියාව විශ්වවිද්‍යාලය තුළ කිසිදු බාධාවකින් තොරව සමාන අවස්ථා ලබාගැනීම සහිතව සපුරාගත හැකි බවට තහවුරු වීම.
- විශ්වවිද්‍යාලීය භෞතික පසුබිම/වටපිටාව ගොදුරුකරණයෙන්, කෙනෙහිලි කිරීම්, හිරිහැර කිරීම් මෙන්ම මානසික හා ශාරීරික වධබන්ධන වලින් තොර කිරීම: කිසිදු උක්ත කී කාරණාවක් ප්‍රායෝගිකව නොවන ලෙසට වගබලා ගැනීම සඳහා අදාළ ක්‍රියාපටිපාටි හා නීති රීති එක හා සමානව ක්‍රියාවට නැංවීම.
- කිසියම් හෝ සමානාත්මතාවය බිඳ වැටෙන කටයුත්තක දී ඒ හා සම්බන්ධව හඬ නැගීම: එදිනෙදා කටයුතුවලදී අවධානයෙන් ඒ පිළිබඳ යෙදීම මගින් අසමානාත්මතාවය මතුවන යම් සිද්ධියක්, අවස්ථාවක් හෝ යම් එවන් වූ ක්‍රියාවකදී අදාළ පාර්ශ්වයන් හා බලධාරීන් ඒ පිළිබඳව අදාළ යෝජනා හා අදහස් සහිත ව දැනුවත් කිරීම.

**06 ක්‍රියාත්මක කිරීම**

විශ්වවිද්‍යාලය සමානාත්මතා ප්‍රතිපත්තිය ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීමේදී ඒ හා සබැඳුණු පැහැදිලි ප්‍රතිපත්ති රාමුවක් පවතී. ඒ තුළ දී එහි සාමාජිකයන් විසින් එකී ප්‍රතිපත්ති රාමුව තුළ පිහිටන පරිදි ප්‍රමුඛ වන අරමුණු තුලින් සමානාත්මතාවය ව්‍යාප්ත කර ප්‍රචලිත කර එය පවත්වාගෙන යාමට කටයුතු කරනු ලබයි. විශ්වවිද්‍යාලය විසින් සමානාත්මතාවය බිඳ හෙලන පරිදි කෙරෙන කිසිදු ක්‍රියාවක් අනුමත නොකරයි. විශ්වවිද්‍යාලය විසින් සමානාත්මතා ප්‍රවර්ධන නිලධාරියෙකු මේ සඳහා පත් කරනු ලබයි.

06.1 සමානාත්මතා ප්‍රවර්ධන නිලධාරී කණ්ඩායම

සමානාත්මතා ප්‍රවර්ධන නිලධාරීන් ලෙස ජ්‍යෙෂ්ඨ අධ්‍යයන සභිකයෙකු පත් කරනු ලබන අතර හෙතෙම විසින් සමානාත්මතාවය සම්බන්ධව ඇතිවන ගැටලු පිළිබඳව සොයා බැලිය යුතු මෙන්ම නිරන්තර සමාලෝචනය, නඩත්තුව, හා ප්‍රතිපත්ති යාවත්කාලීන කිරීම් ද වගකීමෙන් යුතුව ඉටු කළ යුතුය. නිලයේ ධූර කාලය වසරකි. මෙම සමානාත්මතා ප්‍රවර්ධන නිලධාරියා හැරුණුකොට විශ්වවිද්‍යාලීය පීඨ (8) නියෝජනය වන පරිදි නියෝජිතයන් ජ්‍යේෂ්ඨ හෝ නොවන අටදෙනෙක් ද අනධ්‍යයන කාර්ය මණ්ඩලය නියෝජනය වන පරිදි එක් නියෝජිතයෙක් ද (නිරීක්ෂණ) ස්වේච්ඡාමය වශයෙන් රාජකාරි කරන පරිදි වන සේ නිලධාරීන් දසදෙනෙකුගෙන් මේ කණ්ඩායම සමන් වේ. මේ සියලු දෙනාගේම ධූරකාලය වසරකි. නිලධාරි මඩුල්ල විසින් සමානාත්මතාවය කෙලෙසන ඕනෑම කටයුත්තකදී ඒ සම්බන්ධව නිසි ක්‍රියාමාර්ග ගැනීමට බැඳී සිටී. හැකියාව පවතින ඕනෑම සන්නිවේදන මාධ්‍යයකින් හෝ ලිඛිතව හෝ හමුවී වාචිකව ඕනෑම සමානාත්මතා කඩවීමක් සම්බන්ධව දැනුම් දිය හැකි ය.

6.2 දැනුවත්භාවය ගොඩනැගීම

සමානාත්මතා පප්‍රතිපත්තිය පැනවීමට පෙර සාමාජිකයන්ට මේ සම්බන්ධව මනා දැනුවත් බවක් ලබාදීම සමානාත්මතා ප්‍රවර්ධන නිලධාරීන් විසින් සිදු කරනු ලබයි. සමානාත්මතාවය පිළිබඳ දැනුවත්භාවයක් හා සුදුසුකම්ලත් මෙන්ම පුහුණුවලත් අධ්‍යයන කාර්ය මණ්ඩලය සාමාජිකයින් මෙහිදී පුහුණුකරුවන් ලෙස තෝරා ගැනේ.

අවබෝධතා පුහුණු සැසිය තුළදී මෙම සමානාත්මතා ප්‍රතිපත්තියෙහි ඇති වැදගත්කම සන්නිවේදනය කරනු ලබන අතරම එහි ප්‍රයෝජන ගෙන හැර පාමින් එය ප්‍රායෝගිකව සෑම පීඨයක් දෙපාර්තමේන්තුවක් මෙන්ම පරිපාලන දෙපාර්තමේන්තුවක් තුළින්ම ක්‍රියාවට නැංවීමේ වැදගත්කම හා අවශ්‍යතාවය පෙන්වා දෙනු ලැබේ.

මෙම පුහුණු කිරීමේ මූලික සැසිය තුළින් සමානාත්මතාවය සුරැකීමට එක් එක් සාමාජිකයාට දායක විය හැකිය ආකාරය, ක්‍රියාවට නැංවිය යුතු පිළිවෙල ආදිය සේම ප්‍රති ප්‍රතිපත්ති ප්‍රවර්ධනය පිළිබඳවද දැනුවත් කරයි. මෙම ප්‍රතිපත්තදාමයි විශ්වවිද්‍යාලයීය නිල වෙබ් අඩවියේ පළ කිරීමට ප්‍රථම සියලු විශ්වවිද්‍යාල සාමාජිකයින් මේ පිළිබඳව දැනුවත් කර පුහුණු කිරීම විශේෂත්වයකි. එසේම ප්‍රතිපත්ති මාලාව විශ්ව විද්‍යාලය පීඨ හා දෙපාර්තමේන්තු දැන්වීම් පුවරු වල ප්‍රදර්ශනය කරනු ලැබේ.

එසේම සිදු කරනු ලබන ප්‍රතිපත්ති යාවත්කාලීන කිරීම් හා සංස්කරණයන් සියල්ල අප්‍රමාදිව සියලු විශ්වවිද්‍යාලය සාමාජිකයන් වෙත විද්‍යුත් තැපැල මගින් යොමු කරන අතර ඒ ඔස්සේ සියලු දැන්වීම් පුවරු හා විශ්වවිද්‍යාලය වෙබ් අඩවියේ ද ප්‍රදර්ශනය කරනු ලබයි. එසේම මේ අනුව සමානාත්මතා කඩ වීමකට බඳුන් වන ඕනෑම අයෙකුට මෙම ප්‍රති ප්‍රතිපත්ති එස්සේ දැනුවත් වී අදාළ නිලධාරීන්ට පැමිණිලි කළ හැකි අතර ඒ අනුව අදාළ පීඨ හා දෙපාර්තමේන්තු නිසි ක්‍රියාමාර්ග ගනුලබයි.

**07. අධීක්ෂණය හා ඇගයීම.**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මඟින් සමානාත්මතා ප්‍රතිපත්තිය සුරක්ෂිත කිරීම පිණිස කාර්යක්ෂම ක්‍රමවේදයක් ලෙස එය අධීක්ෂණය හා ඇගයීම යොදාගනු ලබන්නේ එය ඒකාත්මිකව පිළිගැනීම හා පවත්වාගෙන යාම අරමුණු කරගෙනය.